# 05. නෛපාතික කෘදන්ත

ක්‍රියා මූල කාල, පුරුෂ, වචන ආදිය පදනම් කරගෙන ප්‍රත්‍යය ගන්වා විවිධ ස්වරූප බවට පත් කළ හැකි ය. ක්‍රියා පද අතර එසේ වෙනස් කළ නොහැකි ක්‍රියා පද වර්ග කිහිපයක් ඇත. වාක්‍යවල නිපාත ස්වරූපයෙන් යෙදෙන එම ක්‍රියා කෘදන්ත නිපාත හෙවත් නෛපාතික කෘදන්ත යනුවෙන් හැඳින්වේ.

ඒවා අතුරින් අපර ක්‍රියා සහ ආවස්ථික ක්‍රියා යනු මොනවාදැයි හඳුනා ගනිමු.

- සුජාත පොඩි හාමුදුරුවෝ බුදුන් වැඳ පන්සලට වඩිති.
- මල පරවී බිමට වැටෙයි.
- ගොවියා කෙත බලමින් සතුටු වෙයි.
- කුකුළන් හඬලද්දී අපි ඒ ගමන ආරම්භ කළෙමු.

ඉහත වැකි දෙස බලන විට පැහැදිලි වන්නේ එක් වැකියක ක්‍රියා පද දෙක බැගින් ඇති බවයි. වාක්‍ය අවසානයේ යෙදී ඇති ප්‍රධාන ක්‍රියාව අවසාන ක්‍රියාවයි. වඩිති, වැටෙයි, වෙයි, කෙළෙමු යන ක්‍රියා පද වැකි පහේ ප්‍රධාන ක්‍රියා පද වේ. වැඳ, පරවී, බලමින්, හඬලද්දී යන ක්‍රියා පද අප්‍රධාන ක්‍රියා පද ලෙස හැඳින්වේ. ප්‍රධාන ක්‍රියාවට විශේෂණ ව යෙදෙන මෙම අප්‍රධාන ක්‍රියා පුරුෂ භේදයක්, ලිංග භේදයක් හෝ සංඛ්‍යා භේදයක් නොතකා, නිපාත ස්වරූපයෙන් එක සේ යෙදෙයි. එසේ හෙයින් ඉහත වැකිවල සඳහන් වැඳ, පරවී, බලමින්, හඬලද්දී යන අප්‍රධාන ක්‍රියා නෛපාතික කෘදන්ත (නිපාත ක්‍රියා) යනුවෙන් හැඳින්වේ. සිංහල භාෂාවේ මෙබඳු ක්‍රියා වර්ග හතරක් දක්නට ලැබේ.

* පූර්ව ක්‍රියා
* මිශ්‍ර ක්‍රියා
* ආවස්ථික නිපාත ක්‍රියා (අසම්භාව්‍ය ක්‍රියා)
* අපර ක්‍රියා

මෙයින් පූර්වක්‍රියා හා මිශ්‍ර ක්‍රියා ඔබ දෙවන වසරේදී හඳාරන්නට ඇත. මෙහිදී ආවස්ථික නිපාත ක්‍රියා (අසම්භාව්‍ය ක්‍රියා) හා අපර ක්‍රියා පිළිබඳ සලකා බලමු.

## ආවස්ථික නිපාත ක්‍රියා (අසම්භාව්‍ය ක්‍රියා)

කියත උන් මෙ තෙපල
ආයේය ඇදුරු ගුත්තිල

මෙහි ''කියත'' යන ක්‍රියාවෙන් අවසාන ක්‍රියාව වූ ආයේය යන්න පිළිබඳ අදහසක් පළ කෙරෙයි. ආයේය යන ක්‍රියාව සිදුවන අවස්ථාව ඉන් ප්‍රකාශ වේ. එම අවස්ථාර්ථය ප්‍රකාශ කරන ක්‍රියා ආවස්ථික ක්‍රියා නමින් හැඳින්වේ. අසම්භාව්‍ය ක්‍රියා නමින් ද ඒවා නම් කරේ.

ආවස්ථික ක්‍රියා කොටස් දෙකකට යෙදේ.

1. කාලාර්ථයෙහි ආවස්ථික ක්‍රියා
2. අනියමාර්ථයෙහි ආවස්ථික ක්‍රියා

## කලාර්ථයෙහි ආවස්ථික ක්‍රියා

ආවස්ථික ක්‍රියාවෙන් කාලය පිළිබඳව පැවසේ නම්, එය කාලාර්ථයෙහි ආවස්ථික ක්‍රියා ලෙස හැඳින්වේ.

උදා:- 1. නිළිය ගී [ගයද්දී] නළුවා රැඟුම් පෑවේය.
2. වැසි [වසිත] සොරු පලායති.
3. [නැගෙත] සිත තුටු කොට - රියද පැන නැංගේය අහසට.

## අනියමාර්ථයෙහි ආවස්ථික ක්‍රියා

යමක් සිදුවීමට හෝ සිදු නොවීමට ඇති අවකාශය පිළිබඳ දක්වන අවස්ථා අනියමාර්ථයෙහි ආවස්ථික ක්‍රියා ලෙස හැඳින්වේ.

උදා:- 1. අස බමුණ ගම් වැසි
මග **රැඳුණ** අද තෝ නසි
ගෙට **ගිය** අඹුව නසි
අතුරුදන්වී කියා මේ ලෙසි

2. දිලිය පස් මහල් පායෙහි මිණි කිරණ
**බැලිය** හැකි විනම් දක වැඳ යා කළණ

3. මා එය **කරතොත්** තොපට ද දන්වමි.

4. ශිෂ්‍යයන් **පැමිණියහොත්** පන්තිය පැවැත්වෙයි.

ආවස්ථික ක්‍රියාවෙන් කියවෙන කර්තෘ අනුක්ත ව සිටී.

### ක්‍රියාකාරකම 5.1

පහත සඳහන් ආවස්ථික ක්‍රියා පද යොදා වැකිය බැගින් තනන්න.

1. වයතොත්
2. බැලුව
3. දෙසත්දී
4. වැස්සොත්
5. කියත
6. නොකළහොත්
7. යතුදු
8. එත
9. වණත
10. ඇසුව

මීළඟට අපි අපර ක්‍රියා (අනාගත නිපාත ක්‍රියා) පිළිබඳ සලකා බලමු.

## අපර ක්‍රියා (අනාගත නිපාත ක්‍රියා)

**ලබනුව සිව් දහන්**
**පැවිදි කරවා දුන් කමටහන්**

මෙහි ''ලබනුව'' යන්න අනාගත නිපාත ක්‍රියා පදය (අපර ක්‍රියා) නමින් හැඳින්වේ. ලබනුව යන්න අනාගත අර්ථය හඟවන්නකි. ඒනිසා මෙවැනි ක්‍රියා ''අනාගත නිපාත ක්‍රියා'' නමින් හැඳින්වේ. වර්තමානයේ මේ අනාගත ක්‍රියාර්ථය හඟවනු සඳහා ලබන්න, ලබන්නට යන රූප ද යෙදේ.

උදා:- 1. නිවන් සුව ලබන්න දහමෙහි හැසිරේ.
2. නිවන් සුව ලබන්නට දහමෙහි හැසිරේ.

### ක්‍රියාකාරකම 5.2

අපර ක්‍රියාර්ථය ප්‍රකාශවන පරිදි වාක්‍ය පහක් නිර්මාණය කරන්න.